සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 11 - 2023

# පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 03 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. ප්‍රජාතන්ත්‍රවාදය ජීවන ක්‍රමයක් ලෙස වැදගත් වන්නේ,
    (1) පාලනය සඳහා නියෝජිතයින් තෝරා ගනු ලබන්නේ බහුතර කැමැත්ත මත සිදුවන නිසාය
    (2) නීති සම්පාදන කටයුතු ජනතා නියෝජිතයින් මගින් සිදු කරන නිසාය.
    (3) අන්‍ය මත ගරුකරමින්, සාකච්ඡා මගින් තීරණ වලට එළඹෙන නිසාය
    (4) ආණ්ඩු බලය හිමිවන්නේ ජනතා ඡන්දයෙන් වැඩි නියෝජිත පිරිසක් පත් වන දේශපාලන පක්ෂයට වන නිසාය.

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මැතිවරණ කොට්ඨාස බෙදා වෙන් කරනු ලබන්නේ කුමන ආයතනය මගින්ද?
    (1) මැතිවරණ කොමිෂන් සභාව මගින්
    (2) සීමා නිර්ණය කොමිෂන් සභාව මගින්
    (3) රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින්
    (4) අධිකරණ සේවා කොමිෂන් සභාව මගින්

03. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අන්තර්ගත විය යුතු කරුණු නිවැරදිව අඩංගු පිළිතුර තෝරන්න.
    (1) රටක පුරවැසියා සතු කාර්යයන්
    (2) ආගමික විශ්වාසයන් හා ඇදහිලි
    (3) සිරිත් විරිත් හා සම්ප්‍රදායයන්
    (4) පුරවැසියා සතු මූලික අයිතිවාසිකම්

04. ''බාහිර බාධකයන්ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්තාව නිදහස'' ලෙස ප්‍රකාශ කරන ලද්දේ,
    (1) ජී.ඩී.එච්. කෝල් විසිනි
    (2) සීලර් විසිනි
    (3) ඇරිස්ටෝටල් විසිනි
    (4) ගානර් විසිනි

05. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක දැකිය හැකි විශේෂ ලක්ෂණයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    (1) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය පත් වේ.
    (2) ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඍජු සම්බන්ධතාවයක් පවතී.
    (3) විධායකය අංශ දෙකකින් සමන්විත වේ.
    (4) විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට ඍජුව බැඳී නැත.

06. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක බලය යන්නෙන් අදහස් කරන්නේ,
    (1) රාජ්‍ය පාලනයේදී ජනාධිපතිට හිමි වන බලයයි
    (2) රාජ්‍ය පාලන කටයුතු පවත්වා ගෙන යාමට රාජ්‍යයට ඇති හැකියාවයි.
    (3) රාජ්‍ය පාලනයේදී පාර්ලිමේන්තුව සතු බලයයි.
    (4) රාජ්‍ය පාලන කටයුතු වල දී ජනතාව සතු බලයයි.

07. රාජ්‍ය සතු බලයෙහි අවසාන හිමිකරුවා වන්නේ,
    (1) එම රාජ්‍යයේ ව්‍යවස්ථාදායකයයි
    (2) එම රාජ්‍යයේ විධායකයයි
    (3) එම රාජ්‍යයේ ජනතාවයි
    (4) එම රාජ්‍යයේ අධිකරණයයි

08. ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කරන නියෝජිතයා කවුද?
    (1) මහ ඇමතිය
    (2) අමාත්‍ය මණ්ඩලයයි
    (3) ආණ්ඩුකාරවරයායි
    (4) ජනාධිපතිවරයායි



EXAMRESULTS.LK

- **පහත සඳහන් ප්‍රකාශ හොඳින් අධ්‍යයනය කොට අංක 9 සහ 10 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන පනතක් මගින් පමණක් පරිපාලන බලතල විමධ්‍යගත කිරීම

B ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය ඉහළ අධිකරණයට පැවරීම.

C මධ්‍යම ආණ්ඩුවට අවශ්‍ය ඕනෑම අවස්ථාවක විමධ්‍යගත කළ බලතල නැවත පවරා ගත හැකි වීම.

D ඉහළ මන්ත්‍රණ සභාවක් සහ ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම.

09. ඒකීය රාජ්‍ය සතු ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) AB (2) AC (3) BC (4) BD

10. සන්ධීය රාජ්‍ය සතු ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) AB (2) AC (3) BC (4) BD

11. ඇමරිකාවේ ව්‍යවස්ථාදායකය වන කොංග්‍රස් මණ්ඩලය ආයතන දෙකකින් සමන්විත වේ. එම ආයතන දෙක ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා සාමී මන්ත්‍රී මණ්ඩලය
(2) මහජන මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් සභාව
(3) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා රාජ්‍ය සභාව.
(4) මහජන මන්ත්‍රී මණ්ඩලය හා ෆෙඩරල් අධිකරණය

12. බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකුගේ වගකීම වන්නේ,

(1) තමන්ගේ සංස්කෘතිය ඉස්මතු වන සේ කටයුතු කිරීමය.
(2) වැඩි පිරිසක් අයත් වන සංස්කෘතියට ගරු කිරීමය.
(3) සියළුම සංස්කෘතීන්ට ගරු කරමින් සමානව සැලකීමය.
(4) විවිධ සංස්කෘතීන් මිශ්‍රවීම වැළැක්වීමට කටයුතු කිරීමය.

13. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව ක්‍රියා කිරීම මගින්,

(1) මාධ්‍ය නිදහස ආරක්ෂා කරගත හැකිවේ (2) අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය වේ.
(3) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් බිහි වේ. (4) අයිතිවාසිකම් ආරක්ෂා වේ.

14. යහ පාලනයේ මූලික ගුණාංගයක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) විනිවිද භාවයකින් යුතුව කටයුතු කිරීම. (2) රාජ්‍ය සේවය දේශපාලනීකරණයට ලක් කිරීම.
(3) මාධ්‍ය නිදහස වාරණයට ලක් කිරීම. (4) නිලධාරී වාදය ඉස්මතු කිරීම

15. යහ පාලනය යනුවෙන් හඳුන්වන්නේ,

(1) රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියයි.
(2) රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොරව කටයුතු කිරීමයි.
(3) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියයි.
(4) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියයි.

16. ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලියක් නොවන්නේ මින් කුමක්ද?

(1) නිෂ්පාදනය (2) බෙදා හැරීම (3) අපනයනය (4) පරිභෝජනය

17. නිෂ්පාදන සාධක සඳහා කරන ගෙවීම් වලට අදාළව 'පොලී' ගෙවනු ලබන්නේ කවර සාධකයක් සඳහාද?

(1) භූමිය (2) ශ්‍රමය (3) ව්‍යවසායකත්වය (4) ප්‍රාග්ධනය

- **පහත සඳහන් ප්‍රකාශ කියවා 18 සහ 19 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A දේපළ අයිතිය රාජ්‍ය සතුවේ.

B මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේදී පොදු යහපත උදෙසා කටයුතු කරයි.

C තරඟකාරී වෙළඳපොලක් ඇත.

D නිෂ්පාදන සාධක වල අයිතිය පෞද්ගලික අංශය සතුවේ.

E මධ්‍ය සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථිකය මෙහෙයවනු ලබයි.

F ලාභය අරමුණු කරගෙන නිෂ්පාදන කටයුතු සිදු කරයි.

18. සමාජවාදී අර්ථ ක්‍රමයක ලක්ෂණ දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ABC (2) BCD (3) ABD (4) ABE

19. ධනවාදී අර්ථ ක්‍රමයක ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ACD (2) CDF (3) DFE (4) BCD

20. ආර්ථික භාණ්ඩයක් හා ආර්ථික නොවන භාණ්ඩයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) හිරු එළිය හා ඖෂධ (2) ආහාර හා ඇඳුම්
(3) ආහාර හා ජලය (4) හිරු එළිය හා ආහාර

21. ගෝලීයකරණයේ ධනාත්මක බලපෑමක් වන්නේ,

(1) දේශීය සංස්කෘතියට විවිධ බලපෑම් එල්ල වීම.
(2) ආර්ථිකය විවිධාංගීකරණය වීම.
(3) කාර්යක්ෂම කර්මාන්ත වෙළඳ පොලෙන් ඉවත් වීම
(4) ගෙවුම් ශේෂ තත්වය අයහපත් වීම

22. ගැටුම් වර්ග පුළුල් ලෙස බෙදා දැක්විය හැකි ක්ෂේත්‍ර දෙක දැක්වෙන පිළිතුර තෝරන්න්.

(1) සාර්ව ගැටුම් හා සූක්ෂම ගැටුම් (2) පුද්ගල ගැටුම් හා සමාජීය ගැටුම්
(3) අභ්‍යන්තර ගැටුම් හා අන්තර් ජාතික ගැටුම් (4) ජාතික ගැටුම් හා සාර්ව ගැටුම්

23. ගැටුම් නිරාකරණයට මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කිරීමේදී,

(1) මධ්‍යස්ථ හා පක්ෂපාතී ලෙස කටයුතු කළ යුතුය.
(2) හොඳ සවන් දෙන්නෙකු හා වංක පුද්ගලයෙකු ලෙස ක්‍රියා කළ යුතුය.
(3) විචාරශීලී හා නිර්මාණශීලී පුද්ගලයෙකු ලෙස කටයුතු කළ යුතුය.
(4) තමාගේ විසඳුම් අන් අය මත පටවන්නෙකු විය යුතුය.

24. පහත 'අ' තීරුවේ ගැටුම් වර්ගද 'ආ' තීරුවේ ඒවාට නිදසුන්ද දක්වා ඇත.

| අ | ආ |
|---|---|
| (1) දේශපාලන ගැටුම් | (a) කුරුස යුද්ධය |
| (2) වාර්ගික ගැටුම් | (b) ඊශ්‍රායලය හා පලස්තීනය අතර ගැටුම් |
| (3) ආගමික ගැටුම් | (c) දකුණු අප්‍රිකාවේ වර්ණභේද ගැටුම් |

'අ' තීරුවේ අනුපිළිවෙලට 'ආ' තීරුවේ නිදසුන් ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

(1) abc (2) bca (3) cba (4) bac

25. ගැටුම් අවම කර ගැනීම සඳහා පුරවැසියෙකු තුළ වර්ධනය කරගත යුතු සමාජ ගුණාංගයක් වන්නේ,

(1) අන් මත ගරු කිරීමයි (2) ජීවිත හානි වැළැක්වීමයි.
(3) මානසික ආතතිය අවම කිරීමයි. (4) නිර්මාණාත්මක චින්තනය වර්ධනය කිරීමයි.

26. දේශීය නීතිය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර පවතින අනෙක් නීති වර්ග දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) උඩරට නීතිය හා තේසවලාමෙයි නීතිය. (2) අපරාධ නීතිය හා ජාත්‍යන්තර නීතිය
(3) අපරාධ නීතිය හා සිවිල් නීතිය (4) සිවිල් නීතිය හා මුස්ලිම් නීතිය

27. නීතියේ ගුණාංගයකි,

(1) මිනිසාගේ අභ්‍යන්තර හැසිරීම් පාලනය කිරීම. (2) නීති කඩකල විට දඬුවම් ලබා නොදීම
(3) නීතිය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වීම. (4) අධිකාරී බලය පදනම් කරගෙන නීති පැනවීම.

28. නීතිපති තුමාගේ කාර්යයන් වලට අයත් වන්නේ කුමන කරුණුද යන්නපහත සඳහන් කරුණු වලින් තෝරන්න.

A ප්‍රමාණවත් සාක්ෂි නොමැති විට විත්තිකරුවන් නිදහස් කිරීම.
B රජය සම්බන්ධ නඩු වලදී අවශ්‍ය උපදෙස් ලබාදීම.
C ජූරි සභා සම්බන්ධ කටයුතු
D මරණ දඬුවම නියම වූවෙකුගේ නිර්දේශ ජනාධිපතිට ලබාදීම.
E ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පනවන නඩු වලදී පාර්ශවකරුවෙක් ලෙස පෙනී සිටීම.

(1) ABC (2) ABD (3) BCD (4) BDE

29. මානව හිමිකම් කොමිෂමට සාමාජිකයින් පත් කරන්නේ කවුරුන් විසින්ද?,

(1) අග්‍රවිනිශ්චයකරවරයා විසිනි (2) පාර්ලිමේන්තුව විසිනි
(3) ජනාධිපති විසිනි (4) නීතිපති විසිනි

30. අපරාධ නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි බරපතල වැරදි පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) මිනීමැරුම්, ළමා අපචාර, ඉඩම් ආරවුල් (2) රාජ්‍ය විරෝධී ක්‍රියා, ස්ත්‍රී දූෂණ, මිනීමැරුම්
(3) ලිංගික අපරාධ, මංකොල්ලකෑම්, වානිජ කටයුතු (4) ස්ත්‍රී දූෂණ, ඉඩම් ආරවුල්, මංකොල්ලකෑම්

31. මුස්ලිම් නීතිය අනුව නඩු විසඳීම සඳහා පළමු වරට කාති උසාවි පිහිටුවන ලද්දේ කුමන වර්ෂයේද?
(1) 1929 (2) 1806 (3) 1706 (4) 1505

32. ලන්දේසි යුගයේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන අධිකරණ දිස්ත්‍රික්ක තුන ඇතුළත් වන පිළිතුර තෝරන්න.
(1) කොළඹ, මහනුවර, යාපනය (2) කොළඹ, ගාල්ල, මහනුවර
(3) කොළඹ, යාපනය, ගාල්ල (4) කොළඹ, මාතර, ගාල්ල

33. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවට අනුව ඇති කළ ප්‍රධාන වෙනස්කමක් වන්නේ,
(1) ශ්‍රී ලංකාව ස්වාධීන රාජ්‍යයක් කිරීමයි.
(2) විධායක ජනාධිපතිධුරයක් ඇති කිරීමයි.
(3) ද්වි මාණ්ඩලික පාර්ලිමේන්තුවක් හඳුන්වා දීමයි.
(4) මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ප්‍රථම වරට ඇතුළත් කිරීමයි.

* විධායක සහ ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන් කීපයක් පහත ප්‍රකාශ වලින් දැක්වේ. ඒවා හොඳින් අධ්‍යයනය කර 34 සහ 35 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
A රාජ්‍ය සේවය පාලනය කිරීම.
B නීති පැනවීම.
C රාජ්‍ය ආරක්ෂක කාර්යයන්.
D විදේශ කටයුතු පිළිබඳ කාර්යයන්.
E ජනතාවගේ දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම.
F විධායකයට අවශ්‍ය බහුතරය සැපයීම.

34. විධායකය සතු බලතල හා කාර්යයන් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ABC (2) BCD (3) ACD (4) CDF

35. ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන් දැක්වෙන පිළිතුර තෝරන්න,
(1) ABC (2) CDE (3) CDF (4) BEF

36. ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් පිහිටුවා ඇත.
(2) ප්‍රාදේශීය සභා වලට නමක් නියම කිරීමේ බලය ජනාධිපති සතුය.
(3) සෑම ප්‍රාදේශීය සභාවකම ප්‍රධානියා වන්නේ සභාපතිය.
(4) ලංකාවේ ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් ජීවත් වන්නේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුලය.

37. සාමදාන විනිශ්චයකාරවරු පත් කිරීමේ බලය ඇත්තේ,
(1) ජනාධිපතිටය. (2) නීතිපතිතුමාටය
(3) අග්‍රවිනිශ්චයකාර වරයාටය. (4) අධිකරණ අමාත්‍යවරයාටය.

38. 1948 දෙසැම්බර් 10 දින එක්සත් ජාතීන් විසින් සම්මත කරන ලද්දේ,
(1) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි
(2) කාන්තා අයිතිවාසිකම් සම්බන්ධ සීඩෝ සම්මුතියයි
(3) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියයි
(4) ආදිවාසි හා ගෝත්‍රික ජනතාව පිළිබඳ සම්මුතියයි

39. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හට යහපත් හා තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට අවස්ථාව ලබාදීම,
(1) ජන සමාජයේ වගකීමක් වේ.
(2) රජයේ මූලික වගකීමක් වේ.
(3) රජයේ මෙන්ම සමාජයේද යුතුකමක් මෙන්ම වගකීමක් ද වේ
(4) ආරක්ෂක අංශ වල වගකීමක් වේ.

40. ළමා අයිතිවාසිකම් පිළිබඳව සම්මුතිය සකස් කිරීමේදී සැකිල්ලට ගෙන ඇති මූලික අරමුණු 4 නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) අධ්‍යාපනය, ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය
(2) ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය, සහභාගීත්වය
(3) සෞඛ්‍ය, අධ්‍යාපනය, පැවැත්ම, සංවර්ධනය,
(4) අධ්‍යාපනය, සහභාගීත්වය, පැවැත්ම, සංවර්ධනය

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 11 - 2023

# පුරවැසි අධ්‍යාපනය

නම/ විභාග අංකයඃ

## II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (i) යුරෝපයේ ජාතික රාජ්‍යයන් බිහි වීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

(ii) ලෝකයේ පවතින රාජ්‍යයන් ගේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් නම් කරන්න.

(iv) විවිධ ජාතීන් වෙළඳාම සඳහා පැමිණීම ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් ඇතිවීම කෙරෙහි බලපෑ ප්‍රබල සාධකයකි. එසේ වෙළඳාම සඳහා පැමිණි විවිධ ජාතීන් වර්ග 2ක් ලියන්න.

(v) වර්තමානයේ ක්‍රියාත්මක වන නව ලිබරල්වාදී වෙළඳපොල ආර්ථික ක්‍රමයක මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

(vi) ගැටුම් ඇතිවන පාර්ශව දෙකක් ලියන්න.

(vii) නීතියේ මූලශ්‍ර දෙකක් ලියන්න.

(viii) ලංකාවේ වර්තමාන පාර්ලිමේන්තුවට නියෝජිතයින් පත්වන ආකාර දෙක ලියන්න.

(ix) මානව හිමිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා දෙකක් ලියන්න.

(x) කාන්තාවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ලිච්ඡවී රජ දරුවන් අනුගමනය කළ චාරිත්‍ර ධර්ම දෙකක් ලියන්න.

(ලකුණු 10 × 2 =20)

(02) ''ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියන් අයිතිවාසිකම් භුක්ති විඳින අතර යුතුකම් ඉටුකිරීම ඔවුන්ගේ වගකීමකි''

(i) යුතුකම් බෙදා දැක්විය හැකි ආකාර දෙක ලියන්න. (ල. 02)

(ii) රාජ්‍ය විසින් පුරවැසියන් කෙරෙහි ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් තුනක් ලියන්න. (ල. 03)

(iii) a. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ පුරවැසියන් සතු වියයුතු ගුණාංග තුනක් ලියන්න. (ල. 03)

b. ඉන් එක් ගුණාංගයක් පිළිබඳ විස්තර කරන්න. (ල. 02)

(03) ''බලය යන සංකල්පය විවිධ ස්වරූප ගනී''

(i) බලයේ විවිධ ස්වරූප දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) පරමාධිපත්‍ය බලයට අයත් මූලික කරුණු තුනක් ලියන්න. (ල. 03)

(iii) a. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව බලතල වෙන් කර ඇති ලයිස්තු තුන නම් කරන්න. (ල. 03)

b. ඉන් එක් ලැයිස්තුවක් පිළිබඳව විස්තර කරන්න. (ල. 02)

(04) ''මිනිස් වුවමනා ඉටුකර ගැනීමේ දී විවිධ ප්‍රශ්න වලට මුහුණ දීමට සිදුවේ.''

(i) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ශිල්පීය ක්‍රම දෙක නම් කරන්න. (ල. 02)

(ii) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරනු ලබන අංශ තුන නම් කරන්න. (ල. 03)

(iii) a. ඕනෑම අර්ථ ක්‍රමයක් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න තුන නම් කරන්න. (ල. 03)

b. ඉන් එක් ප්‍රශ්නයක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ල. 02)

(05) ''මිනිසුන් තුළ පවත්නා විවිධත්වය ගැටුම තුළින් පිළිබිඹු වේ.''

(i) ගැටුම් ඇති වීමට බලපාන හේතු දෙකක් ලියන්න. (ල. 02)

(ii) ගැටුම් නිරාකරණය කර ගැනීමේ ක්‍රම තුනක් නම් කරන්න. (ල. 03)

(iii) a. ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීමේ වාසි තුනක් ලියන්න. (ල. 03)

b. ඉන් එක් වාසියක් පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 02)

(06) ''නීතියට ගරු කිරීම හා අවනත වීම පුරවැසියන්ගේ වගකීමකි''

(I) නීතිය සම්බන්ධයෙන් නිර්වචන ඉදිරිපත් කර ඇති චින්තකයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

(ii) නීතියේ ආධිපත්‍ය තහවුරු වී ඇති සමාජයක දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

(iii) a. අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ගෙන ඇති පියවර 3ක් ලියන්න. (ල. 03)

b. ඉහත ඉන් එක් පියවරක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(07) ''සමාජයේ යහපත් පුරවැසියෙකු ලෙස ජීවත් වීම සඳහා මානව හිමිකම් පිළිබඳ දැනුවත් විය යුතුය.''

(i) මානව අයිතිවාසිකම් බෙදා දැක්විය හැකි වර්ග දෙක ලියන්න. (ල. 02)

(ii) සීඩෝ (CEDAW) සම්මුතිය යටතේ කාන්තාවන්ට හිමිකර දී ඇති අයිතිවාසිකම් තුනක් ලියන්න. (ල. 03)

(iii) a. අන්තර් ජාතික මානව හිමිකම් පනතට අයත් වන ලේඛන තුනක් නම් කරන්න. (ල. 03)

b. ඉන් එක් ලේඛනයක් පිළිබඳ විස්තර කරන්න. (ල. 02)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(4) | 4 -(1) | 5 -(4) | 6 -(2) | 7 -(3) | 8 -(3) | 9 -(2) | 10 -(4) |
| 11-(2) | 12-(3) | 13-(2) | 14-(1) | 15-(1) | 16-(3) | 17-(4) | 18-(4) | 19-(2) | 20-(3) |
| 21-(2) | 22-(3) | 23-(3) | 24-(2) | 25-(1) | 26-(3) | 27-(4) | 28-(2) | 29-(3) | 30-(2) |
| 31-(1) | 32-(3) | 33-(2) | 34-(3) | 35-(4) | 36-(2) | 37-(4) | 38-(1) | 39-(3) | 40-(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i)
- රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ
- පුනරුදය
- ධනවාදය ගොඩනැගීම
- විද්‍යාත්මක දැනුම වර්ධනය වීම

(ii) ඒකීය රාජ්‍යය හා සංධීය රාජ්‍යය

(iii) මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා

(iv) අරාබි ජාතිකයින්, චීන ජාතිකයින්, ඉන්දීය ජාතිකයින්, යුරෝපා ජාතිකයින්

(v)
- රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකකරණය කිරීම
- වෙළඳපොල තත්වයන් මත මිල තීරණය වීමට ඉඩ සැලකීම.
- ආයෝජකයන් දිරි ගැන්වීම.
- පෞද්ගලික අංශයට ඉඩ සැලසීම.
- පාලන නීති රීති සීමා අවම කිරීම.
- ආර්ථික කටයුතු වලට රාජ්‍ය අංශයේ මැදිහත් වීම සීමා කිරීම, .......... යනාදිය

(vi) පුද්ගලයා තුළ, පුද්ගලයින් අතර, ජන කණ්ඩායම් අතර, රටවල් අතර.

(vii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, විවිධ අණපනත්, අධිකරණ තීන්දු, නීති විශාරදයින්ගේ මත, සිරිත් විරිත්, ආගම.

(viii) මහජනතාවගේ ඡන්දයෙන් හා ජාතික ලැයිස්තුවෙන්.

(ix)
- 1215. මැග්නා කාර්ටා ගිවිසුම
- බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත
- ඇමෙරිකානු නිදහස් ප්‍රකාශනය
- ප්‍රංශ ප්‍රකාශනය
- රුසියන් විප්ලවය

(x)
- අවිවාහක කුල කුමරියන් ආරක්ෂා කිරීම
- විවාහක කුල කාන්තාවන් ආරක්ෂා කිරීම

(02) (I) නීතිමය යුතුකම් හා සදාචාරාත්මක යුතුකම්

(ii)
- නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
- සමානාත්මතා මූලධර්මය ආරක්ෂා කිරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම.
- රටේ සම්පත් සාධාරණව බෙදී යන පරිදි කටයුතු කිරීම.
- සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම.
- පරිසරය ආරක්ෂා කිරීම ....... යනාදිය.

(iii) a.
- සාකච්ඡා මගින් තීරණ වලට එළඹීම.
- විරුද්ධ මත ඉවසීම
- සහයෝගයෙන් කටයුතු කිරීම.
- නීති ගරුක වීම.
- යුතුකම් ඉටු කිරීම ....... යනාදිය.

b. ආදළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

(03) (i) දේශපාලන බලය, පරිපාලන බලය, සමාජ බලය, ආර්ථික බලය.

(ii) පාලන බලතල, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය.

(iii) a. පළාත් සභා ලැයිස්තුව, සංචෘත ලැයිස්තුව, සමගාමී ලැයිස්තුව,

b. අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

(04) (i) ප්‍රාග්ධන සූක්ෂ්ම ක්‍රමය හා ශ්‍රම සූක්ෂ්ම ක්‍රමය

(ii) රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, රාජ්‍ය හා පෞද්ගලික අංශය.

(iii) a.
- කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේද?
- කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේද?

b. අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

(05) (i) විවිධ ප්‍රතිරූප, වෙනත් අදහස්, සීමා ඇතිවීම, අවහිරතා ඇතිවීම, මානසික තත්ව, පරමාර්ථ ඉටු නොවීම.

(ii) සාකච්ඡා ක්‍රමය, සහමන්ත්‍රණය, මැදිහත් කරණය, බේරුම් කිරීම, සමථ කරණය, උපදේශනය.

(iii) a.
- ජීවිත හානි හා දේපළ හානි වැළැකීම.
- අයිතිවාසිකම් ආරක්ෂා වීම.
- මානසික ආතතිය අවම වීම.
- ආත්ම ගෞරවය ආරක්ෂ වීම.
- සාමය ඇති වීම.
- ජාතික ඒකාබද්ධතාවය ඇතිවීම .......... යනාදිය.

b. අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

(06) (i) T.H. ග්‍රීන් සහ ජෝන් ඔස්ටින්

(ii)
- ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම.
- නීතිය පිළිබඳ පුරවැසියන්ට අවබෝධයක් තිබීම.
- සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිඳලීම.
- නීතිය සැමට සමාන වීම ..... යනාදිය

(iii) a.
- විනිශ්චයකාරවරුන් පත් කිරීම.
- විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම.
- විනිශ්චයකාරවරුන්ගේ වැටුප් රජයේ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවීම.
- අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීම
- අනවශ්‍ය මැදිහත්වීම් පාලනය කිරීම .......... යනාදිය.

b. අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

(07) (i)
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්.
- ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්.

(ii)
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්.
- පවුල් ඒකකය තුළ අයිතිවාසිකම්.
- අධ්‍යාපනයට හා පුහුණුවීමට ඇති අයිතිය.
- සෞඛ්‍යාරක්ෂාවට හා පෝෂණයට ඇති අයිතිය.
- සමාජ වෙනස්කම් වලින් ආරක්ෂා වීමේ අයිතිය .......... යනාදිය.

(iii) a.
- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රකාශනය.
- ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය.
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය.
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පිත සම්මුතිය.
- ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා ඇති කළ වෛකල්පිත සම්මුතිය.
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා ඇතිකළ දෙවන වෛකල්පිත සම්මුතිය.

b. අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(4) | 4 -(1) | 5 -(4) | 6 -(2) | 7 -(3) | 8 -(3) | 9 -(2) | 10 -(4) |
| 11-(2) | 12 -(3) | 13 -(2) | 14 -(1) | 15 -(1) | 16 -(3) | 17 -(4) | 18 -(4) | 19 -(2) | 20 -(3) |
| 21-(2) | 22 -(3) | 23 -(3) | 24 -(2) | 25 -(1) | 26 -(3) | 27 -(4) | 28 -(2) | 29 -(3) | 30 -(2) |
| 31-(1) | 32 -(3) | 33 -(2) | 34 -(3) | 35 -(4) | 36 -(2) | 37 -(4) | 38 -(1) | 39 -(3) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i)
- රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ
- පුනරුදය
- ධනවාදය ගොඩනැගීම
- විද්‍යාත්මක දැනුම වර්ධනය වීම

(ii) ඒකීය රාජ්‍යය හා සංඝීය රාජ්‍යය

(iii) මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා

(iv) අරාබි ජාතිකයින්, චීන ජාතිකයින්, ඉන්දීය ජාතිකයින්, යුරෝපා ජාතිකයින්

(v)
- රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකකරණය කිරීම
- වෙළඳපොල තත්වයන් මත මිල තීරණය වීමට ඉඩ සැලකීම.
- ආයෝජකයන් දිරි ගැන්වීම.
- පෞද්ගලික අංශයට ඉඩ සැලසීම.
- පාලන නීති රීති සීමා අවම කිරීම.
- ආර්ථික කටයුතු වලට රාජ්‍ය අංශයේ මැදිහත් වීම සීමා කිරීම, .......... යනාදිය

(vi) පුද්ගලයා තුළ, පුද්ගලයින් අතර, ජන කණ්ඩායම් අතර, රටවල් අතර.

(vii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, විවිධ අණපනත්, අධිකරණ තීන්දු, නීති විශාරදයින්ගේ මත, සිරිත් විරිත්, ආගම.

(viii) මහජනතාවගේ ජන්දයෙන් හා ජාතික ලැයිස්තුවෙන්.

(ix)
- 1215. මැග්නා කාර්ටා ගිවිසුම
- බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත
- ඇමෙරිකානු නිදහස් ප්‍රකාශනය
- ප්‍රංශ ප්‍රකාශනය
- රුසියන් විප්ලවය

(x)
- අවිවාහක කුල කුමරියන් ආරක්ෂා කිරීම
- විවාහක කුල කාන්තාවන් ආරක්ෂා කිරීම

(02) (I) නීතිමය යුතුකම් හා සදාචාරාත්මක යුතුකම්

(ii)
- නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
- සමානාත්මතා මූලධර්මය ආරක්ෂා කිරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම.
- රටේ සම්පත් සාධාරණව බෙදී යන පරිදි කටයුතු කිරීම.
- සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම.
- පරිසරය ආරක්ෂා කිරීම ....... යනාදිය.

(iii) a.
- සාකච්ඡා මගින් තීරණ වලට එළඹීම.
- විරුද්ධ මත ඉවසීම
- සහයෝගයෙන් කටයුතු කිරීම.
- නීති ගරුක වීම.
- යුතුකම් ඉටු කිරීම ....... යනාදිය.

b. ආදළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

(03) (i) දේශපාලන බලය, පරිපාලන බලය, සමාජ බලය, ආර්ථික බලය.
(ii) පාලන බලතල, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය.
(iii) a. පළාත් සභා ලැයිස්තුව, සංචෘත ලැයිස්තුව, සමගාමී ලැයිස්තුව,
b. අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

(04) (i) ප්‍රාග්ධන සූක්ෂ්ම ක්‍රමය හා ශ්‍රම සූක්ෂ්ම ක්‍රමය
(ii) රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, රාජ්‍ය හා පෞද්ගලික අංශය.
(iii) a.
- කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේද?
- කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේද?

b. අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

(05) (i) විවිධ ප්‍රතිරූප, වෙනත් අදහස්, සීමා ඇතිවීම, අවහිරතා ඇතිවීම, මානසික තත්ව, පරමාර්ථ ඉටු නොවීම.
(ii) සාකච්ඡා ක්‍රමය, සහමන්ත්‍රණය, මැදිහත් කරණය, බේරුම් කිරීම, සමථ කරණය, උපදේශනය.
(iii) a.
- ජීවිත හානි හා දේපළ හානි වැළැක්වීම.
- අයිතිවාසිකම් ආරක්ෂා වීම.
- මානසික ආතතිය අවම වීම.
- ආත්ම ගෞරවය ආරක්ෂ වීම.
- සාමය ඇති වීම.
- ජාතික ඒකාබද්ධතාවය ඇතිවීම .......... යනාදිය.

b. අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

(06) (i) T.H. ග්‍රීන් සහ ජෝන් ඔස්ටින්
(ii)
- ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම.
- නීතිය පිළිබඳ පුරවැසියන්ට අවබෝධයක් තිබීම.
- සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිඳලීම.
- නීතිය සැමට සමාන වීම ..... යනාදිය

(iii) a.
- විනිශ්චයකාරවරුන් පත් කිරීම.
- විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම.
- විනිශ්චයකාරවරුන්ගේ වැටුප් රජයේ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවීම.
- අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීම
- අනවශ්‍ය මැදිහත්වීම් පාලනය කිරීම .......... යනාදිය.

b. අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

(07) (i)
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්.
- ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්.

(ii)
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්.
- පවුල් ඒකකය තුළ අයිතිවාසිකම්.
- අධ්‍යාපනයට හා පුහුණුවීමට ඇති අයිතිය.
- සෞඛ්‍යාරක්ෂාවට හා පෝෂණයට ඇති අයිතිය.
- සමාජ වෙනස්කම් වලින් ආරක්ෂා වීමේ අයිතිය .......... යනාදිය.

(iii) a.
- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රකාශනය.
- ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය.
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය.
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පිත සම්මුතිය.
- ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා ඇති කළ වෛකල්පිත සම්මුතිය.
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා ඇතිකළ දෙවන වෛකල්පිත සම්මුතිය.

PAST PAPERS WIKI

b. අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.